ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී ස්වභාවික විද්‍යා ගෞරව උපාධි වැඩසටහන
හයවන මට්ටම - **2022/2023**
අවසාන පරීක්ෂණය **2023**
**STU6313-** ළමා අයිතිවාසිකම්
කාලය පැය තුනයි. **(03)**

---

දිනය - **2023.11.24** වේලාව - ප.ව.**01.30** - ප.ව.**04.30** දක්වා

---

**1** වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, **2** වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට **(03)** ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. "ළමයා" සඳහා වෙන් වූ අයිතිවාසිකම් තිබීම වැදගත් වන්නේ ඇයි දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ශ්‍රී ලංකා රජය විසින් ළමා ප්‍රඥප්තියක් හඳුන්වා දීමේ අරමුණ කුමක් ද? කෙටියෙන් විස්තර කරන්න.

03. බ්‍රිතාන්‍ය සමයේ දී ශ්‍රී ලංකාවේ ළමුන්ගේ සුභ සාධනය වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද පනත් දෙකක් **(02)** කෙටියෙන් විස්තර කරන්න.

04. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතියට අනුව සුරක්ෂණය ලබා දියයුතු ළමයින් කාණ්ඩ පහක් **(05)** නම් කරන්න.

05. ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂණ අධිකාරියේ කාර්යයන් හතරක් **(04)** සඳහන් කරන්න.

06. ළමා අයිතීන් පාලනය කෙරෙන ප්‍රධාන මූලධර්ම තුන **(03)** නම් කරන්න.

07. ශ්‍රී ලංකාවේ වීදි ළමුන්ගේ තත්ත්වය නගා සිටුවීම සඳහා ගත හැකි උපාය මාර්ග දෙකක් **(02)** සඳහන් කරන්න.

08. විද්‍යා/ගණිත ගුරුවරයෙකු වශයෙන් ළමයාගේ සහභාගීත්ව අයිතිය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී තහවුරු කර ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් **(02)** කෙටියෙන් දක්වන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) ජීවත්වීමට ඇති අයිතිය යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(ii) සංවර්ධනය වෙමින් පවතින රටවල දැකිය හැකි ළමුන්ගේ ජීවත්වීමට ඇති අයිතිය කඩවන අවස්ථා හතරක් **(04)** සඳහන් කර ඉන් දෙකක් **(02)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ළමුන්ගේ ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීම සඳහා පාසල් ප්‍රජාවට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් **(02)** උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) "වර්ධනය" හා "සංවර්ධනය" යන සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) "සමස්ත සංවර්ධනයේ පදනම සෞඛ්‍ය හා කායික සංවර්ධනය වේ." වර්තමාන ශ්‍රී ලංකාවේ පවතින සමාජ තත්ත්වය තුළ ළමුන්ගේ වර්ධනය හා සංවර්ධනය පිළිබඳ අයිතිවාසිකම් කඩවන අවස්ථා දෙකක් **(02)** උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ඉහත ඔබ විසින් සඳහන් කරන ලද අවස්ථා අවම කිරීමට රටක් වශයෙන් ගත හැකි ක්‍රියාමාර්ග හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න, (ලකුණු 08)

11. (i) විශේෂ අවශ්‍යතා සහිත ළමුන් යනුවෙන් හඳුන්වන්නේ කවුරුන් ද? (ලකුණු 03)

(ii) විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ අයිතිවාසිකම් සුරැකීමට සහ ඔවුන්ට සහාය වීමට පාසලට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් **(03)** දක්වන්න. (ලකුණු 06)

(iii) විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සමාජානුයෝජනය කිරීමේ දී දෙමාපියන් සතු කාර්යභාරය කරුණු තුනක් **(03)** දක්වමින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iv) විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ අයිතිවාසිකම් සුරැකීමට රජයට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් **(02)** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

12. (i) "වර්තමානය වන විට පාසල් ළමුන් බහුලව විවිධ මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම ප්‍රබල සමාජ ගැටලුවක් බවට පත් වී ඇත."
මෙම ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 04)

(ii) මත්ද්‍රව්‍ය භාවිතයේ අහිතකර බලපෑම් පිළිබඳ ව පාසල් ළමුන් සහ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා, විධිමත් සංවිධානයක් ලෙස පාසලට ගත හැකි උපාය මාර්ග හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) නව යෞවනයන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම වළක්වා ගැනීම සඳහා දෙමාපියන් කටයුතු කල යුත්තේ කෙසේදැයි නිදසුන් දෙකක් **(02)** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

13. (i) ළමා අපයෝජනයේ ආකාර හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) වර්තමාන සමාජයේ දැකිය හැකි ළමා අපයෝජනයට හේතුවන කරුණු තුනක් **(03)** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාව තුළ තවමත් ළමා අපයෝජනය වළක්වා ගැනීමට අසමත් වීමට හේතු වන්නා වූ කරුණු දෙකක් **(02)** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ළමා අපයෝජනයෙන් ආරක්ෂා වීමට සිසුන් සහ දෙමාපියන් දැනුවත් කිරීම සඳහා පාසලට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් **(02)** පැහැදිලි කරන්න. (ලකුණු 05)

හිමිකම් ඇවිරිණි.